シンハラ語



# විදේශීය නේවාසික අත්පොත

ජපානයේ අපරාධ ක්‍රියාවලීන්ට
සම්බන්ධ නොවී සුරක්ෂිත හා
සාමකාමී ජීවිතයක් ගත කිරීම.

තෝකියෝ මහා නාගරික රාජ්‍ය කාර්යාලය

සහයෝගය සිදු කිරීම

තෝකියෝ මහා නාගරික පොලිස් දෙපාර්තමේන්තුව වෙතින්

තෝකියෝ ප්‍රාදේශීය ආගමන සේවා කාර්යාංශය

# අන්තර්ගතය


හැඳින්වීම P.1

ජපානයේ නීති සහ ගති පැවතුම් P.2 ～ P.5

සැලකිල්ලට ලක් විය යුතු ජපන් නීති P.6 ～ P.10

පා පැදියක් පැදීමේදී ප්‍රවේශම් වන්න P.11 ～ P.13

වැඩ කිරීම් වලදී සැලකිලිමත් වන්න. P.14 ～ P.17

ඔබේ නේවාසික පදිංචි කාඩ්පත සංබන්ධව P.18 ～ P.20

මධ්‍යම හා දීර්ඝ කාලීන පදිංචිකරුවන්ගේ වගකීම් වාර්තා කිරීමට බැඳී සිටීම P.21 ～ P.24

ඔබට ගැටලුවක් උද්ගතවීමකදී අමතන්න. P.25

# හැඳින්වීම

## තෝකියෝ මහා නගරයේ වෙසෙන විදේශිකය වෙත


තෝකියෝ මහා නගරයේ බොහෝ විදේශිකයන් ජීවත් වෙති. කෙසේ වෙතත්, සමහර විදේශිකයන් ජපන් ජාතිකයින් සමඟ භාෂාව, සංස්කෘතිය සහ ජීවන රටාවේ වෙනස්කම් හේතුවෙන් කරදරයට පත්ව සිටිති.
මෙයට අමතරව, ජපන් නීතිය නොදන්නා මෙන්ම එය වැරදි අයුරින් මතක තබා, නොදැනීම නීතිය උල්ලංඝනය කරන සමහර පුද්ගලයින් ද සිටිනු ලබයි.
විදේශිකයන්ට ජපානයේ ගති පැවතුම් සහ නීති තේරුම් ගැනීමට මෙන්ම සුරක්ෂිත හා ආරක්ෂණ ජීවිතයක් ගත කිරීම පිණිස මෙම අත්පොත තෝකියෝ මහා නගරය විසින් නිර්මාණය කරන ලදි.



# ජපානයේ නීති සහ ගති පැවතුම්

## ◆ කැලි කසළ නියමිත කසළ භාජනයකට දමන්න





කැලි කසළ පාරට නොදමන්න.

## ◆ කැලි කසළ බැහැර කිරීම සඳහා වන නීති රීති අනුගමනය කරන්න




කැලි කසළ බැහැර කිරීමේදී **එම දිනය, වේලාව, ස්ථානය සහ කසළ වර්ග පිළිබඳව** අවධානය යොමු කරන්න.




තොග වශයෙන් අපද්‍රව්‍ය නීති විරෝධී ලෙස බැහැර නොකරන්න.

අපද්‍රව්‍ය බැහැර කිරීම, ඔබ ජීවත් ඒ ඒ නගර ශාලාව විසින් තීරණය කරනු ලබන නීති රීති අනුගමනය කරන්න.

## ◆ කරුණාකර ගෘහ කුලී කොන්ත්‍රාත්තුවේ අන්තර්ගතය නිරීක්ෂණය කරන්න.









ගෘහ අයිතිකරුගේ අවසරයකින් තොරව, තවත් ඔබ සමඟ ජීවත්වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව වැඩි කිරීමට, වෙනත් පුද්ගලයෙකුට කාමරයක් කුලියට දීමට, කාමරයක් අලුත්වැඩියා කිරීමට හෝ සුනඛයන් හා බළලුන් වැනි සුරතල් සතුන් තබා ගැනීමට ඔබට නොහැකිය!

ගිවිසුමේ නියමයන් පිළිපැදීමට අපොහොසත් වූ විටක ගෘහයෙන් ඉවත් කිරීමේ නියෝගයක් ලැබිය හැකිය.

## ◆ කොරිඩෝවන් තුල හෝ පඩි පෙළ මත කිසිවක් ස්ථාන ගත නොකරන්න.



කාමරයෙන් බැහැර ඇති කොරිඩෝ සහ පඩි පෙළවල් වෙනත් අය භාවිතා කරයි.
යම් දෙයක් එහි ඇතිවිටක ගින්නක් හෝ භූමිකම්පාවක් සිදු වූ විට ඔබට ඉවත් වීමට නොහැකි වනු ඇත.

## ◆ ඔබේ කාමරයේ හෝ කොරිඩොවන් තුල ශබ්ද නඟා කථා කිරීම මෙන්ම අධික ශබ්ද සහිත සංගීත ඇසීම් ආදිය නොකරන්න.





ඝෝෂාකාරි ශබ්ධ හා හඬ නඟා කථා කිරීම අවට සිටින අයට කරදරයක් විය හැකිය.

ඝෝෂාකාරි ශබ්ධ නඟන විටක, පොලීසිය වෙත පැමිණිලි කරන අතර පොලිස් නිළධාරින්ගේ අවධානයට ලක් වනු ලබයි.

## ◆ බස් රථ හා දුම්රිය තුලදී ජංගම දුර කථන තුලින් හා හඬ නඟා කථාබස් කිරීම නොකරන්න.





දුර කථන ඇමතුම් හඬ හා ශබ්ධ නඟා කථාබස් කිරීම බස් රථ හා දුම්රිය මගීන්ට අවහිරතා ඇති විය හැකිය.
ඔබේ හඬ නැඟීම ඔබව කරදරකාරි තත්වයකට පත් කිරීමකට ඉඩ ඇත.

ජනතාව ජීවත්වන සහ බොහෝ පිරිසක් ගැවසෙන ස්ථාන වලදී ජපානයේ ගති පැවතුම් අනු ගමනය කරමු.

## වයස අවුරුදු 20 ට වැඩි අයට පමණක් මත් පැන් සහ දුම් පානය කළ හැකිය.





ජපානයේ වයස අවුරුදු 20 ට අඩු අයට (වයස අවුරුදු 20 ට පත් නොවු) මත් පැන් හෝ දුම් පානය කිරීමට අවසර නැත.

## කරුණාකර දුම් පානයට නියමිත ස්ථානයකදී පමණක් පානය කරන්න.





ඇවිදිමින් දුම් පානය කිරීම හෝ දුම් පානයට නියමිත ස්ථාන වලින් බැහැරව නොකරන්න.
එසේම, දුම් වැටි කොටස් මාර්ගයෙහි නොදමන්න.
ප්‍රතිපත්තිමය වශයෙන්, තෝකියෝ මහ නගර රෙගුලාසි වලට අනුව ගෘහස්ථ පහසුකම්වලදී දුම්පානය තහනමිය.


# සැලකිල්ලට ලක් විය යුතු ජපන් නීති

## ◆ මගී වාර ප්‍රවේශ පත්‍ර හෝ සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත අන් අය සමඟ හුවමාරු කිරීම නොකරන්න.




**වෙනත් අයකුගේ මගී වාර ප්‍රවේශ පත්‍රයක්, සෞඛ්‍ය රක්ෂණ කාඩ්පතක් හෝ මයි නම්බර් කාඩ්පත භාවිතා කිරීමට අවසර නොමැත.**
**එසේම, ඔබේ මගී වාර ප්‍රවේශ පත්‍රය, සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත හෝ මයි නම්බර් කාඩ්පත වෙනත් අයකුට දීමට අවසර නොමැත.**
මෙය නීතිය උල්ලංඝනය කිරීමක් වන අතර දණ්ඩනීය වරදකි.

## ◆ යමෙකුගේ නැතිවූ දෙයක් හමුවූ විටක එය පොලිස් කුටියට භාර දෙන්න.



**එසේ හමුවූ මුදල් පසුම්බි, මුදල්, කාඩ් පත් තමා සන්තක කිරීම කල නොහැක.**
මෙය නීතිය උල්ලංඝනය කිරීමක් වන අතර දණ්ඩනීය වරදකි.

ඔබේ යම් දෙයක් නැතිවූ විටක, නැතිවූ අයිතම වාර්තාවක් ඉදිරිපත් කරන්න.
නැති වූ දෙය නැවත සමු වූ විට එය ඔබ වෙතට ලැබෙනු ඇත.

## ◆ සාප්පු සොරකම් කිරීම අපරාධයකි.



**සාප්පු සොරකම් කිරීම යනු භාණ්ඩයක් ගෙවීමකින් තොරව වෙළඳසැලකින් රැගෙන යාම වේ.**
සාප්පු සොරකම් කිරීම මෙන්ම **සොරකම් කිරීම, ප්‍රචාහනය කිරීම, සෝදිසියෙන් සිටීම හෝ යමෙකුට පැන යාමට උදව් කිරීම අපරාධයකි.**
ජපානයේ සාප්පු වල ආරක්ෂක කැමරා සවි කර ඇති අතර ආරක්ෂක රැකවලුන් එහි මුර සංචාරයේ යෙදේ.
සාප්පු සොරකම් කිරීම ඔබ කිසි දිනක නොකල යුත්තකි.

## ◆ නවතා ඇති හෝ අත් හැර දමන ලද්දාවූවද, යම් අයකුගේ පා පැදි ගෙන පැදීම නොකල යුතුයි.



**දුම්රිය ස්ථාන හෝ මාර්ග වල නවතා ඇති පා පැදි රැගෙන පැදීම නොකරන්න.**
මෙය නීතිය උල්ලංඝනය කිරීමක් වන අතර දණ්ඩනීය වරදකි.

## ◆ අන් පුද්ගලයන්ගේ කුඹුරු වතුවල එලවළු, පලතුරු හෝ සතුන් සොරකම් කිරීම නොකල යුතුයි.

## ◆ නිසි අවසරයක් නොමැතිව ගංගා වල හෝ මුහුදු වල මාලු හෝ බෙල්ලන් ඇල්වීම නොකරන්න.

## ◆ අන්තරාදායක අයිතමයන් රැගෙන යාම් ඊම් නොකරන්න.



පිහියා සහ ගම් මිරිස් ද්රාවණ



**හේතුවක් නොමැතිව පිහියා වැනි අන්තරාදායක අයිතමයන් රැගෙන යාම් ඊම් නොකරන්න.**
මෙය නීතිය උල්ලංඝනය කිරීමක් වන අතර දණ්ඩනීය වරදකි.
පහත දැක්වෙන කරුණු අන්තරාදායක අයිතමයන් රැගෙන යාමට හේතුවක් නොවේ.

- සවකීය ආරක්ෂාව පිණිස රැගෙන යාම් ඊම්.
- පහසු නිසා රැගෙන යාම් ඊම්.
- මෝස්තරයක් ලෙසට රැගෙන යාම් ඊම්.
- රැකියාවේදී හෝ කඳවුරු බැඳීමේදී එය භාවිතා කිරීමෙන් පසු පිරිසිදු කිරීම කරදරකාරී බැවින් බෑගයක තබා ගැනීම.

## ◆ නීති විරෝධී මත් ද්රව්‍ය සන්තකයේ තබා ගැනීම සහ භාවිතාව අපරාධයකි.




**ජපානයේ පහත සඳහන් මත් ද්රව්‍ය සන්තකයේ තබා ගැනීමට හෝ භාවිතා කිරීම කල නොහැකිය.**

● උත්තේජක ● ගංජා (මරිජුවානා) කොකේන්
● හෙරොයින් ● එම්ඩීඑම්ඒ ● භයානක මත් ද්‍රව්‍ය ආදිය.


එය එක් වරක් පමණක් වුවද භාවිතා කළත් එය අපරාධයක් වනු ඇත.
සන්තකයේ තබා ගැනීම සහ භාවිතාව කිසි දිනක නොකරන්න.
ජපානය තුලට ගෙන ඒමද අපරාධයකි.

## ◆පහත ක්‍රියාවන් අපරාධයකි! පහසුවෙන් ලාභ ලැබිය හැකිය යන පොරොන්දු වලට ප්‍රවේශම් වන්න.

- ජංගම දුරකථන මුදල් කාඩ් හෝ බැංකු පොත් විකිනීම හුවමාරුව.





- වෙනත් අයෙකු වෙනුවෙන් ජංගම දුරකථනයක් හෝ බැංකු ගිණුමක් සඳහා ගිවිසුම් ගත වීම.





- අන්තර්ජාලයෙන් වෙනත් පුද්ගලයෙකුගේ මූල්‍ය කාඩ් භාවිතා කරමින් නිෂ්පාදන ආදිය ඇණවුම් කිරීම, යනාදි.



- වෙනත් කෙනෙකුගේ මූල්‍ය කාඩ් පතක් භාවිතා කොට මුදල් ආපසු ගැනීම.





- වෙනත් අයකුගේ නම භාවිතා කොට එවනු ලබන පසුම්බි භාර ගැනීම. වෙනත් කෙනෙකුට හෝ නම් කරන ලද ස්ථානයකට යම් දෙයක් යැවීම.




වෙනත් අයකුගේ නම භාවිතා කොට එවනු ලබන පසුම්බි භාර ගැනීම

නම් කරන ලද ස්ථානයකට යම් දෙයක් යැවීම

- අඩංගු දේ නොදැන වෙනත් පුද්ගලයෙකුගේ නම ලියා ලිපි හා පසුම්බි භාර ගෙන යමෙකුගේ ඉල්ලීම මත ඒවා යැවීම.




## සැලකිලිමත් වෙන්න!

අපරාධ සංවිධාන එවැනි ක්‍රියාවන් පිටුපස සිටී.
අපරාධයක් කිරීමේ චේතනාවක් නොතිබුනද
ඔබ අපරාධ සංවිධානයක් සමඟ සහයෝගයෙන්
කටයුතු කර ඇත.
පහසුවෙන් මුදල් ඉපයීමක් ලෙස පෙනුනද
කිසි විටක එවැනකට සංබන්ධ නොවන්න.



# පා පැදියෙන් ගමන් යන විට ප්‍රවේශම් වන්න.

## ◆ඔබ පා පැදියක් මිලට ගන්නා විට හෝ ලැබුණු විට, කරුණාකර අපරාධ වැළැක්වීමේ ලියාපදිංචි කිරීමේ ක්‍රම වේදය සිදු කරන්න.




**ඔබ පා පැදියක් මිලට ගන්නා විට** ▶ අපරාධ වැළැක්වීමේ නව ලියාපදිංචි කිරීමේ ක්‍රම වේදය අත්‍යාවශ්‍ය වේ.

**ඔබට පා පැදියක් ලැබුණු විට:** ▶ අපරාධ වැළැක්වීමේ ලියාපදිංචියට නම වෙනස් කිරීම අනිවාර්ය වේ.

අපරාධ වැළැක්වීමේ ලියාපදිංචි කිරීම් ලේඛණ යනාදිය “පා පැදි අපරාධ ආරක්ෂණ ලියාපදිංචි කිරීමේ ස්ථානය” යනුවෙන් ලකුණ පෙන්වන පා පැදි සැලෙන් ඉල්ලුම් කල හැකිය.
අපරාධ වැළැක්වීමේ ලියාපදිංචි කිරීමේ නම වෙනස් කිරීම සඳහා, ගාස්තුවක් ගෙවීම, නේවාසික පදිංචි කාඩ්පත සහ පා පැදි අපරාධ වැළැක්වීමේ ලියාපදිංචි කාඩ්පතක් (ඔබට එවැන්නක් තිබේ නම්) අවශ්‍ය වේ.

## ◆වෙන් කර දී ඇති නියමිත නැවතුම තුල පමණක් පා පැදිය ගාල් කරන්න.




වෙන් කර දී ඇති නියමිත නැවතුම තුල ගාල් නොකර, එසේත් නැතිනම් දුම්රිය ස්ථාන ඉදිරිපිට ආදි තැන්වල නවත්වන විටකදී එය ඉවත් කරනු ලබයි!
එසේ ඉවත් කල විටක, එය නැවත ලබා ගැනීමට ගාස්තුවක් ගෙවිය යුතුය.

## ◆ජපානයේ, මෝටර් රථ වලට සමාන නීති පා පැදි වලටද අදාළ වේ!

**පා පැදි ආරක්ෂිතව භාවිතා කිරීම සඳහා නියාමන පහක් ඇත.**

### 1 සාමාන්‍යයෙන් පා පැදි සඳහා මාර්ගය වන අතර , පදික වේදිකාව යනු විශේෂිත අවස්ථාවකදීය.





කෙසේ වෙතත්, පහත දැක්වෙන අවස්ථා වලදී ඔබට පා පැදියෙන් පදික වේදිකාවේ ගමන් කළ හැකිය.



- පදික වේදිකාවේ “සාමාන්‍ය පා පැදි පදික වේදිකාවට අවසර ඇත” යනුවෙන් ලකුණක් ඇති විටක
- පදවන පුද්ගලයා වයස අවුරුදු 13 ට අඩු දරුවෙකු වන විට, ජ්‍යේෂ්ඨ පුරවැසි වයස අවුරුදු 70 හෝ ඊට වැඩි එසේ නැතිනම් ශාරීරික ආබාධ සහිත පුද්ගලයකු වූ විටක.
- ඉදිකිරීම් ආදිය නිසා මාර්ගයේ වම් කෙළවරේ පැදවීමට දුෂ්කර වූ විට ආදි ලෙස.

### 2 වම් පැත්තේ ධාවනය කරන්න



ඔබ පාරේ පා පැදියක් පදවන විට, වම් පැත්තේ ධාවනය කළ යුතුය, එය මෝටර් රථයකට සමාන වේ. දකුණත ගමනාගමනය තහනම්ය.

## 3 පදිකයින්ට පදික වේදිකාවේ ප්‍රමුඛතාවය ඇත. පා පැදි මාර්ගයේ කෙලවරින් ගමන් කිරීමයි.



පදික වේදිකාවේ පා පැදිය පදවන විට, මාර්ගය අසල වහාම නැවැත්වීමට ඉඩ සලසන වේගයකින් ධාවනය කරන්න.පදිකයින්ට ගමන් කිරීම ඔබ අවහිර වේනම්, එහි නැවතීමට වග බලා ගන්න.

## 4 ආරක්ෂක නීති නිරීක්ෂණය කරන්න



බීමතින් පා පැදි පැදවීම තහනම්ය



දෙදෙනෙකු ගමන් කිරීම තහනම්ය



සමාන්තරව එකට සිට පැදවීම තහනම්ය



කුඩයක් සවිකොට පැදවීම තහනම්ය



රාත්‍රියේදි පා පැදි ලාංපු භාවිතා කරන්න



මංසන්ධිවලදී රථ වාහන සංඥාවන් පිළිපදින්න. නැවතී ආරක්ෂාව තහවුරු කර ගන්න

## 5 ආරක්ෂක හිස් වැසුම් පළදින්න



තෝකියෝ මහ නගර සභාව පා පැදි භාවිතයේදී ආරක්ෂක හිස් වැසුම් රෙකමදාරු කරනු ලබයි.

◆ ඔබට තෝකියෝ හි පා පාදිය භාවිතා කිරීමට අවශ්‍ය නම්, පුද්ගලික තුවාල අනතුරු ආවරණ රක්ෂණයක් ඇතුලත් වී තිබිය යුතුය.

# වැඩ කිරීම් වලදී පූර්වාරක්ෂාව

◆ ඔබ අර්ධකාලීනව වැඩ කරන විට, කරුණාකර සුදුසුකම් නොලත් ක්‍රියාකාරකම්වල කල්තියාම කටයුතු කිරීමට අවසර ලබා ගන්න.










ආගමන විගමන පාලන හා සරණාගතයින් හඳුනා ගැනීමේ පනත මගින් අර්ථ දක්වා ඇති පරිදි විදේශිකයන්ට ඔවුන්ගේ නේවාසික පදිංචිය පිළිබඳ තත්ව සීමාවන් තුළ ජපානයේ සේවය කිරීමට අවසර ඇත.

පහත සඳහන් අවස්ථා වලදී, පෙර ලබා දී ඇති නේවාසික පදිංචිය පිළිබඳ තත්ත්වය යටතේ අවසර දී ඇති ක්‍රියාකාරකම් හැර වෙනත් ක්‍රියාකාරකම්වල යෙදීමට කරුණාකර අවසර ලබා ගන්න



- ජපානයේ රැකියා කිරීමට අවසර නොමැති අය එනම් “ශිෂ්‍ය” හෝ “පවුල් පදිංචි තත්වය” යටතේ සිටින පුද්ගලයකු අර්ධකාලීන රැකියා කරනු ලබන විට
- “තාක්‍ෂණය, මානව ශාස්ත්‍ර ඥාණය, ජාත්‍යන්තර සේවා” වැනි ජපානයේ සේවය කිරීමට අවසර ඇති අය, පදිංචිය පිළිබඳ තත්ත්වයෙහි දක්වා ඇති ක්‍රියාකාරකම් වලට අමතරව අර්ධකාලීන රැකියාවක් කරන විටක

## සැලකිලිමත් වෙන්න!

සුදුසුකම් වලින් බැහැරව ක්‍රියාකාරකම් කිරීමේ අවසරය සඳහා කාල සීමාවන් වැනි දේ තිබේ. සුදුසුකම් තත්වයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා අවසරයකින් නොලබා ඔබ අර්ධකාලීනව වැඩ නොකළ යුතුය, එසේම සීමාවන් සැලකිල්ලට නොගෙන අර්ධකාලීන වැඩ නොකළ යුතුය.

මෙය නීතියට පටහැනි වන අතර දඬුවම් ලැබීමට හෝ පිටුවහල් කිරීමට ඉවහල් විය හැකිය!



නොකරන්න!

## ◆ අවසරයක් ලබා අර්ධකාලීන වැඩ කරන්නේනම්, සතියකට පැය 28 ක් ඉක්මවා වැඩ නොකරන්න.

පැය 28 + පැය 20 = පැය 48 යි





උපරිම පැය 28 යි!

විවිධ ස්ථාන දෙකක සහ වැඩි ගණනක වුවද මුළු එකතුව සතියකට පැය 28 නොඉක්මවිය යුතුය!

කෙසේ වෙතත්,"ශිෂ්‍ය" පදිංචිය පිළිබඳ තත්වයක් ඇති පුද්ගලයන් පාසල විසින් අර්ථ දක්වා ඇති දිගු නිවාඩු කාලයන් තුළ (ගිම්හාන නිවාඩු, ශීත නිවාඩු ආදිය) දිනකට පැය 8 ක් දක්වා (නමුත් සතියකට පැය 40 ක්) වැඩ කළ හැකිය.

## ◆ අවසරයක් ලබා ඔබ අර්ධකාලීනව වැඩ කරන්නේ නම්, වැඩිහිටි විනෝදාස්වාද ස්ථානයන්හි වැඩ නොකරන්න




පහත සඳහන් ස්ථානවල අර්ධකාලීනව වැඩ කළ නොහැක.
● පාරිභෝගිකයන් ආශ්වාදනීය කරමින් හා ආහාර පාණාදියෙන් සංග්‍රහ කිරීමේ ස්නැක්, කැබ්රේට්, පබ්, කැබ්රේට් සමාජ ශාලා, හොස්ට් සමාජ ශාලා වැනි ස්ථාන ● ගේම් මධ්‍යස්ථාන ● මාජන් සාප්පු ● පචින්කෝ මධ්‍යස්ථාන ● "ලව් හෝටල" ● "දුරකථන සමාජ ශාලා" ● "ඩෙඅයි කිස්සා" ● වැඩිහිටි භාණ්ඩ ස්ටොරු ● වැඩිහිටි වීඩියෝ ස්ටෝරු ● පෞද්ගලික කාමර වීඩියෝ සාප්පු ● කැඳවුම් කාන්තා ව්‍යාපාර යනාදිය

මෙවැනි ස්ථානවල, පිරිසිදු කිරීම, පිඟන් සේදීම , වේටර්, ශාලා කාර්ය මණ්ඩලය යනාදී වශයෙන් වැඩ වුවද ඔබට කිරීමට අවසර නැත.

## ◆අවසර ලැබීමෙන් පසු ඔබ අර්ධකාලීන වැඩ කරන්නේ නම්, වැඩිහිටි විනෝදාස්වාදයට සමාන වැඩ කිරීම් වලින් ප්‍රවේශම් වන්න.





ඔබ ලිංගික සේවා සහිත සම්බාහන ශාලාවක හෝ අවන් හල් තුල ගනුදෙනුකරුවෙකු අසල වාඩි වී සංවාදයක හෝ පානයන් කරමින් සිදුකරන සේවාවන් නොකළ යුතුය.
මෙවැනි ස්ථානවල සිටින අයෙකු එය ගැටලුවක් නොවේයැයි පැවසුවද, ඔබ එය විශ්වාස නොකළ යුතුය.
ඔබ වැඩිහිටි විනෝදාස්වාද කටයුතු යෙදී සිටි බව නොදැන සිටියද, දණ්ඩනයකට හෝ රටින් පිටුවහල් කිරීමකට ලක් විය හැකිය.

## ◆පාසැලෙන් ඉවත් වීමෙන් පසුව අර්ධකාලීන රැකියා කිරීමට ඔබට අවසර නොමැත.



ජාත්‍යන්තර ශිෂ්‍යයෙකු පාසැලින් ඉවත් යාම හෝ ඉවත් කිරීම මත ඒම පාසැලින් වෙන්ව ගිය විටක ඇයට / ඔහුට අර්ධකාලීන රැකියා කල නොහැක.
නේවාසික පදිංචි තත්වය සහ සුදුසුකම් රහිත ක්‍රියාකාරකම් කිරීම් අවසරයේ කාල සීමාව පැවතියද, අර්ධකාලීන රැකියාවට අවසර නැත.
පාසැලින් ඉවත් වීමෙන් අනතුරුව ඔබ අර්ධකාලීනව වැඩ කරන්නේ නම්, දණ්ඩනීයකට හෝ බලහත්කාරයෙන් ජපානයෙන් පිටුවහල් කිරීමකට ලක්වේ.

## ◆ ලියාපදිංචි ගාස්තුවක් ඉල්ලා සිටින අර්ධකාලීන රැකියා ගැන ප්‍රවේශම් වන්න.



විදේශිකයෙකුට අර්ධකාලීන රැකියාවක් හඳුන්වා දෙන බවට බොරු පවසා සහ ලියාපදිංචි ගාස්තුවක් ලෙස මුදල් වංචා කිරීම අපරාධයක් ලෙස වේ.
ලියාපදිංචි ගාස්තු සහ හඳුන්වා දීම් ගාස්තු වැනි මුදල් ඉල්ලන අයගෙන් ප්‍රවේශම් වන්න.

## ◆ අවසරයකින් තොරව ඔබගේ නිවස ගාස්තු මත නවාතැන් දීම නොකළ යුතුයි.



මුදල් ලබා ගනිමින් සංචාරකයින් වැනි අයට ඔබේ නිවසේ රැඳී සිටීමට ඉඩ දෙන විට, සෞඛ්‍ය මධ්‍යස්ථානයෙන් අවසර ලබා ගැනීමාදිය, ඒසේත් නැතිනම් ප්‍රාන්ත රජයට හෝ නගර සභාවට දැනුම් දීම අත්‍යාවශ්‍ය වේ.
ඔබ අවසරයකින් තොරව නවාතැන් දීම් කටයුතු කරන්නේ නම් ඔබට දණ්ඩනයකට ලක් වනු ඇත.

# නේවාසික පදිංචි කාඩ්පත

## ◆නිවසින් බැහැර සිටින හැම විටම ඔබගේ නේවාසික පදිංචි කාඩ්පත ළඟ තබා ගන්න.




දීර්ඝ කාලීනව ජපානයේ ජීවත් වන විදේශිකයනට නේවාසික පදිංචි කාඩ්පත නිකුත් කරනු ලබයි.
නිතරම මෙම නේවාසික පදිංචි කාඩ්පත රැගෙන යන්න. නේවාසික පදිංචි කාඩ්පතක් ඔබ ළඟ තබා නොගැනීම නීතිය උල්ලංඝනය කිරීමක් වන අතර ඔබට දඬ ගැසීමක් විය හැකිය.
විදේශ ගමන් බලපත්‍රයක් හෝ සෞඛ්‍ය රක්‍ෂණ සහතිකයක් වැනි වෙනත් හැඳුනුම්පතක් ඔබ සතුව තිබුණද නේවාසික පදිංචි කාඩ්පතක් ඔබ ළඟ තබා ගත යුතුය.

නේවාසික පදිංචි කාඩ්පතක් සඳහා සුදුසුකම් ඇති අය ("මධ්‍යම සිට දීර්ඝ කාලීන පදිංචිකරුවන්" ලෙස හැඳින්වේ) පහත සඳහන් (1) සිට (6) දක්වා මේ යටතට අයත් නොවන අයයි.

1. **මාස තුනක් දක්වා කාලයක් රැඳී සිටින පුද්ගලයින්.**
2. **"තාවකාලික සිටීම" පදිංචිය පිළිබඳ තත්වයක් ඇති පුද්ගලයින්.**
3. **"රාජ්‍ය තාන්ත්‍රික" හෝ "නිල" පදිංචිය සහිත පුද්ගලයින්**
4. **ජපානයේ තායිවාන් ජපාන සබඳතා සංගමයේ නිලධාරීන් (තායිපේ ආර්ථික හා සංස්කෘතික නියෝජිත කාර්යාලය වැනි) හෝ ජපානයේ පලස්තීන සාමාන්‍ය දෙපාර්තමේන්තුව හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්.**
5. **සුවිශේෂ ස්ථිර පදිංචිකරුවන්**
6. **පදිංචිය පිළිබඳ තත්වයක් නොමැති අය**


## ◆ඔබගෙන් නේවාසික පදිංචිය පිළිබඳ කාඩ්පත ඉදිරිපත් කරන ලෙස පොලීසියෙන් හෝ ආගමන සේවා ඒජන්සියේ නිලධාරියෙකු ඉල්ලා සිටින විට කරුණාකර එය ඉදිරිපත් කරන්න.




පොලිස් නිලධාරීන් ආදීන් විසින් නේවාසික පදිංචි කාඩ්පත පෙන්වන ලෙස ඉල්ලා සිටින විට විදේශිකයන් තම පදිංචි කාඩ්පත පෙන්වීමට බැඳී සිටී.

පොලිස් නිලධාරියෙකුගේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් ඔබ නේවාසික පදිංචි කාඩ්පත ඉදිරිපත් නොකළහොත් ඔබට දණ්ඩනයකට ලක් වනු ඇත.

## ◆නේවාසික පදිංචි කාඩ්පත පිණිස වලංගු කාලයක් ඇත.




- **පදිංචිය පිළිබඳ තත්ත්වය "ස්ථිර පදිංචිකරු" / "2 ශ්‍රේණියේ ඉහළ නිපුණතා ඇති වෘත්තිකයා"**
  - වයස අවුරුදු 16 ට වැඩි: නිකුත් කළ දින සිට වසර 7 ක්
  - වයස අවුරුදු 16 ට අඩු: 16 වන උපන්දිනයට පෙර දිනය (*) දක්වා
- **"2 ශ්‍රේණියේ ඉහළ නිපුණතා සහිත වෘත්තිකයෙකු"**
  - අවුරුදු 16 ට වඩා වැඩි: ඔබ රැඳී සිටින කාලය අවසන් වන තුරු
  - වයස අවුරුදු 16 ට අඩු පුද්ගලයින්: නේවාසිකව රැඳී සිටිය හැකි කාලය අවසන් වන දිනය හෝ 16 වන උපන්දිනයට පෙර දිනය (*) අතුරින් පළමුව පැමිණෙන දිනය දක්වා

* 2023 ඔක්තෝබර් 31 වන දිනය අවසානයට පෙර නිකුත් කරන ලද නේවාසික පදිංචි කාඩ්පත් සඳහා, "16 වන උපන්දිනය" වේ.


## ◆ ඔබේ පදිංචිය පිළිබඳ කාඩ්පත ඔබට අස්ථාන ගත වී ඇත්නම්, එය නැවත නිකුත් කිරීම සඳහා වහාම ආගමන සේවා ඒජන්සිය වෙත අයදුම් කරන්න.






නැවත නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට, ඔබට අලාභය පිළිබඳ සාක්ෂි (නැතිවූ සහතිකය, සොරකම් කළ බවට සහතිකය, ආපදා සහතිකය යනාදිය), විදේශ ගමන් බලපත්‍රය සහ ඡායාරූපය අවශ්‍ය වේ. ඔබ ප්‍රාදේශීය ආගමන කාර්යාලයෙන් මුලින්ම විමසන්න.
ඔබ දින 14 ක් තුළ අයදුම් නොකරන්නේ නම්, ඔබ දණ්ඩනයකට ලක් විය හැකිය.

## ◆ ඔබගේ නේවාසික පදිංචිය සඳහා කාඩ්පත කෙනෙකුට දීම හෝ මාරු කර ගැනීම නොකරන්න.




ඔබේ නේවාසික පදිංචි කාඩ්පත අනිසි ලෙස භාවිතා වන බව ඔබ දන්නේනම් පැවරීමක් හෝ භාරදීමක් නොකරන්න.
ඔබගේ නේවාසික පදිංචි කාඩ්පත කල් ඉකුත් වී ඇතත්, ඔබ එය කෙනෙකුට නොදිය යුතුය.
මෙය නීතිය උල්ලංඝනය කිරීමක් වන අතර ඔබට දණ්ඩනයකට හෝ රටින් පිටුවහල් කිරීමක් විය හැකිය.

### ව්‍යාජ හෝ නවීකරණය කරන ලද නේවාසික කාඩ්පත් වලින් පරිස්සම් වන්න!

භාවිතා කිරීම සඳහා ව්‍යාජ හෝ වෙනස් කරන ලද නේවාසික පදිංචි කාඩ්පතක් ඇති විදේශිකයන්ට පදිංචිය පිළිබඳ තත්වයක් තිබුණද ඔවුන්ට දණ්ඩනයකට හෝ රටින් පිටුවහල් කිරීමට ලක් විය හැකිය!



# මධ්‍යම හා දීර්ඝ කාලීන පදිංචිකරුවන්ගේ වගකීම් වාර්තා කිරීමට බැඳී සිටීම

◆ මධ්‍යම හා දිර්ඝ කාලීන පදිංචිකරුවන් නගර සභා හෝ ආගමන කාර්යාංශය වෙත තම ජපානයේ ලිපිණය සහ තමන් අයත් ආයතන (සමාගම, සාප්පු, පාසල, ආදිය) වාර්තා කල යුතුය.




මධ්‍යම හා දිර්ඝ කාලීන පදිංචිකරුවන් විසින් සංක්‍රමණ පාලන හා සරණාගතයින් හඳුනා ගැනීමේ පනත මගින් නියම කර ඇති නිවේදනය ඉදිරිපත් කළ යුතුය.

- පදිංචි ලිපිනය
- නම, උපන් දිනය, ජාතිකත්වය / කලාපය, ස්ත්‍රී පුරුෂ භාවය
- අනුබද්ධ සංවිධාන (ක්‍රියාකාරකම් සංවිධාන, කොන්ත්‍රාත් සංවිධාන) ※
- කලත්‍රයාගෙන් දිකසාදය, කලත්‍රයාගේ අභාවය ※

※ අනුබද්ධ ආයතනය සහ කලත්‍රයා පිළිබඳ දැනුම්දීම තීරණය කරනු ලබන්නේ ඉලක්කගත පුද්ගලයා විසිනි.


දැනුම් දීමේ වගකීම් ඉටු කිරීමට අපොහොසත් වීම හෝ වැරදි හා ව්‍යාජ ගොනු කිරීම දණ්ඩනයකට හෝ ඔබේ නේවාසික පදිංචිය පිළිබඳ තත්වය අවලංගු කිරීමට හේතු විය හැක.

ඔබ දැනුම් දීමේ වගකීම ඉටු කර නොමැති නම්,

- නේවාසික පදිංචිය පිළිබඳ තත්ත්වය වෙනස් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය
- රැඳී සිටිමේ කාලය අලුත් කිරීමට අවසර ඉල්ලුම් කිරීම
- ස්ථිර පදිංචිය සඳහා අවසරය සඳහා ඉල්ලුම් කරන විට,

ඔබව සෘණාත්මක ලෙස ඇගයීමට ලක් කළ හැකි අතර ද. දණ්ඩනයකට ලක් විය හැකිය.

◆ ජපානයට පැමිණියාට පසු, ඔබ ජීවත් වන ස්ථානය තීරණය කරන්නේ නම් හෝ ඔබ පදිංචි ස්ථානය වෙනස් කරන්නේ නම්, ඔබේ නව ලිපිණය පිළිබඳ නාගරික කාර්යාලයට දැනුම් දීමට වග බලා ගන්න.



තීන්දු කරනු ලැබූ ලිපිණය



වෙනස් වන ලිපිණය

නගර සභාවට නව ලිපිණයක් ඉදිරිපත් කිරීමට නේවාසික කාඩ්පතක් අවශ්‍ය වේ.

◆ ඔබ ඔබේ නම, උපන්දිනය, ජාතිකත්වය / කලාපය හෝ විවාහය හේතුවෙන් ස්ත්‍රී පුරුෂ භාවය යනාදිය වෙනස් කරන්නේ නම් කරුණාකර ජපානයේ ආගමන කාර්යාංශයට වහාම දැනුම් දෙන්න.




නම, ජාතිකත්වය / යනාදිය, වෙනස් වීම.

ජපානයේ ආගමන කාර්යාංශයට දැනුම් දෙන විට, ඔබගේ විදේශ ගමන් බලපත්‍රය, ඡායාරූපය සහ නේවාසික පදිංචි කාඩ්පතට අමතරව ඔබේ නම වෙනස් වී ඇති බවට සහතික කරන ද්‍රව්‍ය අවශ්‍ය වනු ඇත.

## ◆ ඔබ පාසලෙන් ඉවත් වීම හෝ ඔබේ සමාගම වෙනස් කිරීම් ආදිය කරන්නේ නම් ජපානයේ ආගමන කාර්යාංශයට වහාම දැනුම් දෙන්න.



උපාධිය,
බඳවා ගැනීම,
මාරු කිරීම,
පාසලෙන් ඉවත් වීම,
යනාදිය.



රැකියා වෙනස් කිරීම,
විශ්‍රාම යාම, යනාදිය.

**පහත නේවාසික පදිංචි තත්වයන් දැනුම්දීම සඳහා අවශ්‍ය වේ.**

මහාචාර්ය, ඉහළ නිපුණතා පුද්ගල, ව්‍යාපාර කළමනාකරු, නීති / ගිණුම් සේවා, වෛද්‍ය සේවා, උපදේශක, අන්තර් සමාගම් පැවරුම්කරු, තාක්ෂණික අභ්‍යන්තර පුහුණුව, ශිෂ්‍ය, පර්යේෂක, ඉංජිනේරු / මානව ශාස්ත්‍ර විශේෂඥ / ජාත්‍යන්තර සේවා, හෙද, විනෝදාස්වාදිතයන්, නිපුණ ශ්‍රමික, විශේෂිත නිපුණතා සේවකයා

**පහත සඳහන් හේතු දැනුම්දීම සඳහා අවශ්‍ය වේ.**

- නම වෙනස් කිරීම, ස්ථාන වෙනස් කිරීම, ඔබ අයත් පාසල හෝ සමාගම වැනි ක්‍රියාකාරී ආයතන වල අතුරුදහන් වීම
- ඔබ අයත් පාසැල් සහ සමාගම් වැනි ක්‍රියාකාරී ආයතනවලින් ඉවත් වීම හෝ මාරු කිරීම
- සමාගම් වැනි ගිවිසුම්ගත ආයතන සමඟ ගිවිසුම් අවසන් කිරීම, නව ගිවිසුම් අවසන් කිරීම

**ඔබගේ දැනුම් දීමේ වගකීම් ඉටු කිරීමට අපොහොසත් වීම හෝ ව්‍යාජ ගොනු කිරීම් කිරීම දණ්ඩනයට ලක් කිරීමට හේතු වේ.**

## ◆ ඔබ "පවුල් වාසය", "ජපන් ජාතිකයාගේ කලත්‍රයා", "ස්ථිර පදිංචිකරුවාගේ කලත්‍රයා" යනාදී තත්වයක මත නේවාසික පදිංචිව තිබෙන්නේ නම්, ඔබ දික්කසාද වී හෝ ඔබේ සහකරු හෝ සහකාරියගේ වියෝවෙන් සිටී නම්, වහාම ජපානයේ ආගමන කාර්යාංශයට කරුණාකර දන්වන්න.




දික්කසාදය,
කලත්‍ර වියෝව

වාර්තා කිරීමට බැඳී සිටින පුද්ගලයා යනු කලත්‍රයා ලෙස කටයුතු කිරීමට ඇති ඔවුන්ගේ පදිංචිය අවසරය පිළිබඳ පදනම වේ.
අනෙක් අය සුදුසුකම් නොලබති. කලත්‍රයා දික්කසාද වූ විට හෝ වියෝ වූ විට, ඔබ ජපානයේ ආගමන කාර්යාංශයට මෙන්ම නාගරික පරිපාලයන් වෙත (දික්කසාද, මරණ දැනුම්දීම) වාර්තා කල යුතුය.
දැනුම්දීම් බැඳීම් සිදු කිරීමට අපොහොසත්වීම හෝ ව්‍යාජ දැනුම්දීම් සිදු කිරීම් දණ්ඩනයන්ට හේතු වේ.

## ◆ දැනුම්දීම් එනම් ඔබ අයත් වන සංවිධානයේ වෙනස්කම්, සහ දික්කසාදය හෝ කලත්‍රයාගේ මරණය වැනි දේ අන්තර්ජාලය හරහා කළ හැකිය.

කරුණාකර මෙමගින් සොයන්න.

| ආගමන සේවා ඒජන්සියේ විද්‍යුත් දැනුම්දීම් පද්ධතිය | සොයන්න |
|---|---|

http://www.immi-moj.go.jp/i-ens/

# ඔබට ගැටවක් ඇති වූ ට ඇමතිය යුත්තේ කාටද?

## ◆ හදිසි අවස්ථාවකදී

අපරාධයක් හෝ අනතුරක් සඳහා

▼

**110 අමතන්න**



ගිනි, අසනීප හෝ තුවාල ඇතිවීම් සඳහා

▼

**119 අමතන්න**



## ◆ නේවාසික පදිංචිය පිළිබඳ තොරතුරු යනාදිය, සඳහා.

### ආගමන තොරතුරු මධ්‍යස්ථානය

**0570 -013904 අමතන්න**



(සතියේ දිනවල 8:30 සිට 17:15)

ඉංග්‍රීසි, චීන, කොරියානු, ස්පාඤ්ඤ, පෘතුගීසි, වියට්නාම, පිලිපීන, නේපාල, ඉන්දුනීසියානු, තායි, ඛමර් (කාම්බෝජය), මියන්මාර්, මොන්ගෝලියානු, ප්‍රංශ, සිංහල සහ උර්දු යන භාෂාවලින් ආධාර ලබා ගත හැකිය!

## ◆ විදේශිකයන්ගේ පදිංචිය පිළිබඳ උපදෙස් ලබා ගැනීම සඳහා

විදේශීය පදිංචිකරුවන්ගේ ආධාරක මධ්‍යස්ථානය
(තෝකියෝ ප්‍රාදේශීය ආගමන කාර්යාංශය)
03-5363-3025 අමතන්න (වෙන් කිරීම් පමණි)
(සතියේ දිනවල 9:00 සිට 17:00)
වෙන් කිරීමේ පෝරමය : https://www.moj.go.jp/isa/support/fresc/fresc_2.1.html
ලිපිනය: යොට්සුයා කුළුණ 13F, 1-6-1 යොට්සුයා, ෂින්ජුකු-කු, තෝකියෝ

外国人在留支援センター FRESC

## ◆ දෛනික ජීවිත පිළිබඳ තොරතුරු සඳහා

තෝකියෝ මහා නාගරික විදේශ පදිංචිකරුවන්ගේ උපදේශන මධ්‍යස්ථානය

| භාෂාව | උපදේශන දිනය | දුර කථන. |
|---|---|---|
| ඉංග්‍රීසි | සඳුදා සිට සිකුරාදා දක්වා | 03-5320-7744 |
| චීන | අඟහරුවාදා සහ සිකුරාදා දිනයන් | 03-5320-7766 |
| කොරියානු | බදාදා | 03-5320-7700 |



【උපදේශන වේලාවන්】 9:30 සිට 12:00 දක්වා, 13:00 සිට 17:00 දක්වා

# විදේශීය නේවාසික අත්පොත




මෙම අත්පොත විවිධ භාෂාවලින් ලබා ගත හැකිය.
තෝකියෝ මහා නාගරික රාජ්‍ය කාර්යාලයේ වෙබ් අඩවියෙන් එය නොමිලේ බාගත හැකිය.

විදේශීය නේවාසික අත්පොත | සොයන්න



https://www.tomin-anzen.metro.tokyo.lg.jp/chian/chiankaizen/gaikokujin/zairyuumanyuaru/index.html

නිකුත් කළේ: තෝකියෝ මහා නාගරික රාජ්‍ය කාර්යාලයේ ජීවන සංස්කෘතික හා ක්‍රීඩා අංශය / පුරවැසි ආරක්ෂණ ප්‍රවර්ධන අංශය / ආරක්ෂක පිළියම් අංශය
2-8-1- නිෂි-ෂින්ජුකු-කු, ෂින්ජුකු-කු, ටෝකියෝ 163-8001
☎ 03-5388-2279

2025年3月発行

シンハラ語版

| 印刷物登録番号 |
| --- |
| （ 6 ）81 |

リサイクル適性Ⓐ
この印刷物は、印刷用の紙へリサイクルできます。